**නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය - 2019**

**-----------------------------------------------------------------**

## 1.1 මතය

**------**

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

### 1.5.1 ලැබිය යුතු මුදල්

--------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05 කටත් වැඩි කාලයක සිට පැවතෙන එකතුව රු.1,604,037 ක් වූ ණයගැති ශේෂයන් අයකර ගැනිමට ප්‍රමාණවත් කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණයේ සඳහන් සමස්ථ ණය ගැති ශේෂයෙන් රු. 22,644 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. මේ පිළිබඳව විවිධ අවස්ථාවල සිහිකැඳවීම් යවා ඇති අතර අදාළ අමාත්‍යාංශ ද දැනුවත් කර ඇත. | ශේෂයන් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අවස්ථා 06 කදී සපයා තිබූ එකතු වටිනාකම රු. 195,858 ක් වූ සේවාවන් වෙනුවෙන් නිකුත් කළ ඉන්වොයිස් සහ 2017 අගෝස්තු 01 දින සිට 2019 ජූලි 31 දක්වා මාස 24 ක කාලයක් ගිවිසුම් ගත බැඳීමකින් තොරව විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාවට සපයා තිබූ සේවාව වෙනුවෙන් නිකුත්කළ රු .2,292,945 ක ඉන්වොයිස් සඳහා වූ මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අවස්ථා 06 කදී සපයා තිබූ රු .52,500 ක මුදලක් ලැබී ඇත. අනෙකුත් ලැබීම් සම්බන්ධව සිහි කැඳවීම් ගිණුම් අංශය මගින් සිදු කර ඇත.<br>ගිවිසුම් ප්‍රකාරව විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව අදාල කාලපරිච්ඡේදය සඳහා සේවාව ලබා ගෙන ඇති බැවින් ලැබිය යුතු ආදායමක් ලෙස ඉන්වොයිස් ගත කර ඇති අතර, ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඉන්වොයිස් සඳහා මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.5.2 අත්තිකාරම්

--------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10ක් ඇතුළත එම අතුරු අග්‍රිමය ගිණුම් අංශය වෙත නැවත පියවිය යුතු වුවත් අවස්ථා 30 ක දී ලබා දී තිබූ එකතුව රු.2,156 900 ක් වූ අතුරු අග්‍රිම දින 2 ත් දින 53 ත් අතර කාල පරාසයක් ප්‍රමාද වී පියවා තිබුණි. | ආයතනයේ විවිධ ව්‍යාපෘති සහ වැඩ සටහන් වල අවශ්‍යතාවන් පරිදි අතුරු අග්‍රිමයන් අධිකාරී බලය හා අනුමැතිය මත නිකුත්කරන අතර අදාල කාර්ය අවසන් වූ වහාම පියවීමේ කොන්දේසියට යටත් වේ. එහෙත් විවිධ ප්‍රායෝගික දුෂ්කරතා සහ ආයතනික අභ්‍යන්තර ක්‍රියා පටිපාටි වල ඇතිවන වලක්වාගත නොහැකි ප්‍රමාදයන් නිසා ඇතැම් අවස්ථා වලදී අග්‍රිම පියවීමේ දී ප්‍රමාදයන් සිදු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාර්යය නිමවූ වහාම අතුරු අග්‍රිම පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(2) (ආ) පරිදි කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවක දී රුපියල් 100,000 ක උපරිමයක් දක්වා තත් කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකිය. මෙම මූල්‍ය සීමාවන් ඉක්මවීමට අවශ්‍ය වන අවස්ථා වල ගණන් දීමේ නිලධාරීයා විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් මගින් මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබා ගත යුතු වුවත් අවස්ථා තුනක දී එකතුව රු.560,000 ක් වූ රු.100,000 ඉක්මවූ අතුරු අග්‍රිම මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරයකින් තොරව ලබා දී තිබුණි. | මුදල් අත්තිකාරම් ලබා ගත් මිනිසුන් රහිත ගුවන් යානා (UAV) ව්‍යාපෘතියේ වැඩ කරන මූලාකෘතිය නිර්මාණය කිරීම හා සංවර්ධනය සඳහා අවශ්‍ය භාණ්ඩ අන්තර්ජාල ජාත්‍යන්තර වෙළඳපොලේ පමණක් ලබා ගත හැකි අතර ක්‍රෙඩිට් කාඩ්පතක් (මුදල් අත්තිකාරමක් සහිතව) භාවිතා කරමින් ජාත්‍යන්තර අන්තර්ජාල සාප්පුවකින් නිර්මාණ විශේෂිත කොටස් සෘජුවම මිලදී ගැනීම ප්‍රසම්පාදන අත්පොත 2018 හි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විමර්ශන 2.5 (සී) සහ 3.1.6 හි මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරන ලදී. ආයතනය සතුව සමාගම් ක්‍රෙඩිට් කාඩ්පතක් නොමැති බැවින් පුද්ගලික ක්‍රෙඩිට් කාඩ්පතක් (මුදල් අත්තිකාරමක් සහිතව) භාවිතා කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දිමේදී භාණ්ඩාගාර අනුමැතිය මත අත්තිකාරම් ලබාදිමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,457,220 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,518,946 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,976,166 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ධාරිතා වර්ධන වියදම් රු. මිලියන 41කින් වැඩිවීමක් වූ නමුත් රජයේ ප්‍රදාන ලැබීම් රු.මිලියන 60 කින් හා වෙනත් ආදායම් රු.මිලියන 2කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තම ආයතනයට ආදායම් උපයා ගැනීම සඳහා භාවිතා කරන විදුලි සංදේශ කුළුන නිසි ලෙස නඩත්තු කර පාරිභෝගිකයන්ට ලබානොදීම හේතුවෙන් ආයතනයට 2019 අගෝස්තු 01 දින සිට කුළුනේ ආදායම අහිමි වී ඇති බව නිරීක්ෂනය විය. 2019 ජූලි සිට අහිමි වූ ආදායම ගිවිසුම ප්‍රකාරව මාසයකට රු.102,763 බැගින් විය. | 2017.08.01 දින සිට 2019.08.19 දිනය වන තුරුම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අප ආයතනයේ පිහිටි කුළුණෙන් අදාල සේවාවන් ලබා ගත් අතර එම කාල සීමාව තුල කුළුණ නඩත්තුව සම්බන්ධයෙන් වන කිසිදු ඉල්ලීමක් ඔවුන් විසින් ආයතනය වෙත යොමු කර නොමැත. කුළුණ සම්බන්ධයෙන් ඉල්ලා ඇති තාක්ෂණික වාර්තාව සහ අකුණු සන්නායක ආරක්ෂාව සම්බන්ධයෙන් වන වාර්තාව යන වාර්තා දෙකම දැනට ආයතනය වෙත ලැබී ඇති නිසා ඒ සම්බන්ධයෙන් වන ඉදිරි කටයුතු ආයතනය විසින් සිදු කෙරෙමින් පවතී. | විදුලි සංදේශ කුළුණ නිසිලෙස නඩත්තු කර අදායම් ඉපයීම සහ සේවා ලබාදීමට කටයුතු කල යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 ඔක්තෝබර් 12 සිට වසර දෙකක වගකීමක් සහිතව CFL හා LED විදුලි බල්බ වල කාර්යසාධන පරීක්ෂාව හා බලශක්ති කාර්යසාධන පරීක්ෂාව සඳහා මිළදී ගත් ලාම්පු පරීක්ෂණ පද්ධතියෙහි (Light Measurement system) වගකීම | ලාම්පු පරීක්ෂණ පද්ධතිය හා ඊට සම්බන්ධ අනුශාංගික උපකරණයන්ගේ දෝෂයන් අවස්ථා දෙකකදී දෙයාකාරයකින් මතු වීම නිසාත්, අදාල යන්ත්‍රයේ වගකීම් කාලය අවසන් වී තිබු | වගකීම් කාලය තුළ අළුත්වැඩියාවන් කරන විට එය ඉක්මනින් කළ නොහැකි නම් එම ආයතනයෙන්ම අමතර උපකරණ ලබාගෙන පද්ධතිය අඛණ්ඩව |

| | | | |
|---|---|---|---|
| | කාලය අවසන් වන දිනය 2017 ඔක්තෝම්බර් 11 වන අතර 2017 ඔක්තෝම්බර් 11 වන දිනම එනම් වගකීම් කාලය තුල රු.925,000 ක් වටිනා Power Analyzer (xitron 2801) යන්ත්‍රය දෝෂ සහිත වී තිබුණි. මෙය වගකීම් කාලය තුල සිදුවූ සිදුවීමක් බැවින් එය නැවත අළුත්වැඩියා කරවා ගැනීමට හෝ ඒ වෙනුවට නව යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු නොකර 2019 ජුනි 25 දින නව යන්ත්‍රයක් එම ආයතනයෙන්ම මිලදී ගෙන තිබුණි. වගකීම් කාලය තුල යන්ත්‍ර පිලිබඳ ආවරණයක් නොකර නව මිලදී ගැනීම ගැටළු සහගත විය. එසේම 2017 ඔක්තෝබර් 17 වන විට mini computer උපකරණය ද ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ලාම්පු පරීක්ෂණ පද්ධතිය අක්‍රියවී තිබුණි. ඒ අනුව 2017 ඔක්තෝබර් 11 දින සිට 2018 නොවැම්බර් 09 දින දක්වා මාස 13 ක කාලයක් මෙම පද්ධතිය අක්‍රිය වී තිබුණු අතර එම දෝෂ නිවැරදි කර සතියක් ඉක්මවූ දින එනම් 2018 නොවැම්බර් 19 වන විට රු. 2,352,000 ක් වටිනා Amatek Power Supply උපකරණයද අක්‍රිය වී තිබුණි. රු.15,479,510 ක් වියදම් දරා මිළදී ගත් පද්ධතියේ වසර 2ක් අවසන් වන විට අමතර උපාංග 03ක් ක්‍රියා විරහිත වී තිබීම නිසා දැරීමට සිදු වූ අතිරේක වියදම රු.3,277,000 ක් විය. | නිසාත්, විගණන නිරීක්ෂණයේ සඳහන් පරිදි එකිනෙකට සම්බන්ධ නොවන විවිධ දෝෂ හේතුවෙන් උපකරණ පද්ධතිය ක්‍රියා විරහිතව පවතී. එබැවින් උපකරණය සැපයුම්කරු හරහා නිෂ්පාදන සමාගම වන ඇමරිකා එක්සත් ජන පදයේ ලැබ්ස්පියර් (labsphere) සමාගම සමග කටයුතු කිරීමේදී ද සැලකිය යුතු කාලයක් අවශ්‍ය විය. | පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පර්යේෂණ හා සංවර්ධන කටයුක්තක් ලෙස සන්නිවේදන අංශය හා තාක්ෂණික අංශය එක් වී පුස්තකාල පරිශ්‍රය තුළ RFID තාක්ෂණය භාවිතය පිළිබඳ සිදු කල පරීක්ෂණය නිම කර තිබුණ ද එම තාක්ෂණය රට තුළ ව්‍යාප්ත කිරීමට සුදුසු වැඩ පිලිවෙලක් ආයතනය සකස් කර නොමැති බැව් නිරීක්ෂණය විය. | ආතර් සී කලාක් ආයතනයේ පුස්තකාලයේ ඇති පොත් 9000 ක් PURNA මෘදුකාංග දත්ත ගබඩාව සහ RFID LAS firmware අතර සංක්‍රමණය කළ හැකි වන පරිදි දත්ත මුල වාර්තා වල අමතර ක්ෂේත්‍ර දෙකක් ස්ථාපිත කිරීම සඳහා පුස්තකාල නිලධාරීන් සහ අදාළ තාක්ෂණික කණ්ඩායම් විසින් PURNA මෘදුකාංග නිර්මාණකරුවන් සම්බන්ධකරගෙන ඇත. මෙය | නිම කළ පර්යේෂණ තුළින් සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | මේ වසර තුළදී සම්පූර්ණ කෙරෙන අතර එය සම්පූර්ණයෙන්ම දේශීය නිෂ්පාදනයක් වන අතර පුස්තකාල විශේෂ අවශ්‍යතාවයක් ඇති පෞද්ගලික සමාගමක් සමඟ සහයෝගී නිෂ්පාදනයක් ලෙස පුස්තකාල වලට අලෙවි කිරීම පිළිබඳ ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | වසර 05 කටත් වැඩි කාලයක සිට භාවිතයට නොගෙන පවතින රු.4,104,435 ක තොගය ආයතනයේ ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට හෝ අවශ්‍යතාවයක් ඇති වෙනත් ආයතනයන්ට නියමිත ක්‍රමවේදයන්ට අනුව විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි. | තොග අයිතම වලින් වැඩි ප්‍රමාණයක් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ඉලෙක්ට්‍රොනික අයිතම වන අතර ඒවා ව්‍යාපෘතිවල ස්වාභාවය අනුව කාලයෙන් කාලයට භාවිතයට ගැනීමේ අවශ්‍යතාවන් මතුවේ. එමෙන්ම එකී ඉලෙක්ට්‍රොනික අයිතම විවෘත වෙළඳ පොලෙන් ඍජුව මිලදී ගැනීමට හැකියාවක් නොමැත. එමනිසා සංවර්ධන සහ පර්යේෂණ අවශ්‍යතා අනුව ඉහළ අගයක් සහිත තොග වත්කම් පවත්වා ගැනීමේ අවශ්‍යතාවයක් ආයතනයට ඇත. එහෙත් දිගු කාලයක් චලනය නොවන තොග අයිතම් හඳුනා ගෙන ඒවා ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | තොග අයිතම මිලදී ගැනීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව මිලදී ගැනීම් කටයුතු සිදුකළ යුතු අතර පවත්නා තොගයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 අගෝස්තු 09 දින සිට වසරක කාලයක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ අත්සන් කරන ලද ගිවිසුම 2017ජූලි 31 වන දිනෙන් අවසන් වී තිබුණි. ආතර් සී ක්ලාක් ආයතනය විසින් 2017 අගෝස්තු 01 සිට 2022 ජූලි 31 දක්වා වසර 05 ක කාලයකට ගිවිසුමක් සකස් කර වසරක් පාසා අළුත් කරන පදනමින් ඉදිරිපත් කර තිබුණ ද 2020 පෙබරවාරි විගණන දිනය වන විටත් එම ගිවිසුම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අත්සන් කර නොතිබුණි. එමෙන්ම 2019 ජූලි 31 | අනතුරුව 2017.08.01 වැනි දින සිට 2022.07.31 දිනය දක්වා වන වසර 05ක් සඳහා වන ගිවිසුම් කෙටුම්පත ආයතනය විසින් 2018.05.02 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. එයට ප්‍රතිචාරයක් නොමැති වූ බැවින් පිළිවෙලින් 2018.08.07, 2018.09.21, 2018.11.30 යන දිනයන්හි සිහි කැඳවීම් ලිපි යවන ලදී. 2019.03.28 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින්, මෙම කෙටුම්පත් ගිවිසුම | ගිවිසුම අත්සන් කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනෙන් පසුව ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ සේවාව ලබා ගැනීම ද නවතා තිබුණි. | වසර 05ක් දක්වා අනුමත කර ඇති අතර ඒ අනුව අදාල ගිවිසුම් කෙටුම්පත අනුමත කර අවසන් ගිවිසුම සකසා එවන මෙන් ආයතනය වෙත දන්වා ඇත. ඒ අනුව, ආයතනය විසින් 2019.05.03 දිනැති ලිපියෙන්, අදාල ගිවිසුම පිටපත් දෙකකින් යුක්තව අත්සන් සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී. | |
| (ඉ) | 2019 ජූනි 17 දිනැති අංක TRC/SM/FMMS/RMS/KAT/GEN/165 දරන ලිපිය මඟින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුකූලතාව පිළිබඳ තාක්ෂණික තක්සේරුවක් සහිතව විදුලි සංදේශ කුළුන සම්බන්ධයෙන් යෝග්‍යතා සහතිකයක් ලබා දෙන මෙන් ඉල්ලුම් කර තිබුණ ද 2019 අගෝස්තු 19 වන විටත් එම වාර්තාව ලබා නොදීම හේතුවෙන් 2019 ජූලි 31න් පසු ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ කුළුනේ සේවය ලබා ගැනීම නවත්වා තිබුන බව නිරීක්ෂණය විය. | 2017.08.01 දින සිට 2022.07.31 දිනය දක්වා වන යෝජිත ගිවිසුම එසේ තිබියදී 2019.06.17 දින නැවත වරක් කුළුණේ තත්ත්ව සහතික වාර්තාවක් සහ අකුණු සන්නායක ආරක්ෂාව සම්බන්ධයෙන් වන වාර්තාවක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඉල්ලුම් කරන ලදී. කුළුණේ තාක්ෂණික වාර්තාව ලබා ගැනීම පිණිස මොරටුව විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලද අතර, අකුණු සන්නායක ආරක්ෂාව සම්බන්ධයෙන් වන වාර්තාව ලබා ගැනීම පිණිස ආයතනයේ ඉලෙක්ට්‍රොනික අංශ ප්‍රධානී වෙත යොමු කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලද තාක්ෂණ වාර්තාව 2020 ජනවාරි මස අගදී ලබා දුන් අතර අදාල වාර්තා දෙක පෙබරවාරි මස මුලදී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.<br>විගණන විමසුමේ සඳහන් පරිදි අදාල සේවාව ලබා ගැනීම සම්බන්ධයෙන් එම ආයතනය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීමට නියමිතය. | ආයතනය ආදායම් උපයන ව්‍යාපෘති විධිමත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | පුස්තකාලය පරිශිලනය සඳහා පාසල් ළමුන්, විශ්වවිද්‍යාල සිසුන් හා විෂයානු බද්ධ ක්ෂේත්‍රයන්ට ඇල්මක් දක්වන පාර්ශවයන්ට අවස්ථාව සලසා දී ඇතත්, | | |
| (අ) | පුස්තකාලයේ ඇති බොහෝමයක් පොත් පරිශීලනයකින් තොරව පවතින බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී එසේ පරිශීලනය කල පාඨකයන් ගණන 10 ක් තරම් අඩු ප්‍රමාණයක් විය . | (i) පුස්තකාලය යනු දැනුම බෙදාහරින ආයතනයක් වන්නා සේම අතත්‍ය (Virtual) වශයෙන් සහ විවිධ සමාජ මාධ්‍ය හරහා ආයතනයේ තාක්ෂණ හා පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පාඨකයින්ට හා ආයතනයේ පුහුණුවන්නන්ට අමතරව ඉහත සඳහන් බාහිර පාර්ශවයන්ද පුස්තකාලයේ සේවය ලබා ගනු ලබයි. | පොත් බැහැරට ගෙනයාම හා පරිශීලනය සඳහා ක්‍රමවත් සුදුසු වැඩපිළිවළක් සැකසිය යුතුය. |
| (ආ) | වටිනාකමින් වැඩි මෙන්ම යම් විෂය ක්ෂේත්‍රයන්ට අදාල වන ඇතැම් පොත් සීමිත පුද්ගලයන් පිරිසක් විසින් මිළදී ගත් දින සිට අත රඳවා ගෙන සිටින බව නිරීක්ෂණය වූ අතර එය පුස්තකාලයේ අභ්‍යන්තර පාලන නීති රීති වලට පටහැනි ක්‍රියාවක් මෙන්ම එම විෂය ක්ෂේත්‍රයන් කෙරෙහි ඇල්මක් උනන්දුවක් දක්වන වෙනත් පාර්ශවයට එම පොත් පරිශීලනයට ඇති අවස්ථාව මඟහැරී යාමක් බැව්ද නිරීක්ෂණය විය. | (ii) වටිනාකමින් වැඩි යම් යම් විෂය ක්ෂේත්‍රයන්ට අදාළ වන ඇතැම් පොත් සුවිශේෂිත පර්යේෂණ කටයුතු වල නිරතවන ඉංජිනේරුවන් සහ පර්යේෂකයන් පරිශීලනය සඳහා ලබා ගන්නා අතර, ඕනෑම පාඨකයෙකු එම අදාළ පොත පිළිබඳ විමසීමක් කළේ නම් වහාම පොත ළඟ තබා ගන්නා ලද පාඨකයාට දැනුම් දී අවශ්‍ය අයට පොත ලබා ගැනීමට කටයුතු සලසා දී ඇත.<br>එමෙන්ම, හඳුන්වාදී ඇති දත්ත පදනම මඟින් ස්වයංක්‍රීයව තමා විසින් බැහැරට ගෙනගොස් ඇති පොත් පිළිබඳව සිහි කැඳවුම් ලිපියක් ලබා දීමට කටයුතු සලසා දී ඇත. | පුස්තකාල නිතිරීති අනුව කටයුතු කල යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුස්තකාලයේ පොත් පිටතට ගෙනයාම පරික්ෂාව සඳහා RFID තාක්ෂණය උපයෝගි කරගත් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය RFID ගේට්ටු 2ක් 2018 වර්ෂයේ දී රු. 1,375,400 ක් වියදම් දරා මිළදී ගෙන තිබුණු අතර ඒවා භාවිතයෙන් තොරව පුස්තකාල පරිශ්‍රයේ තබා ඇති බැව් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | RFID පුස්තකාල ස්වයංක්‍රීයකරණය (RFID-LAS) පද්ධතිය ආතර් සී කලාක් ආයතන විසින් සංවර්ධනය කරන ලද්දේ ජාත්‍යන්තරව විවෘත මූලාශ්‍ර පුස්තකාල කළමනාකරණ පද්ධතියක් වන KOHA (දත්ත සමුදාය) සමඟය. ව්‍යාපෘති ප්‍රවාහය අතරතුර නියමු ව්‍යාපෘතියක් ලෙස RFID LAS ආතර් සී කලාක් ආයතනයේ පුස්තකාලයට යෙදවීය. ආතර් සී කලාක් ආයතනයේ පුස්තකාලයේ භාවිතා කරන කළමනාකරණ මෘදුකාංගය PURNA මෘදුකාංගයයි. (පුද්ගලික සමාගමක් විසින් දේශීයව සංවර්ධනය කරන ලද සංවෘත පද්ධතියකි).<br>KOHA සහ PURNA දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිවල පුස්තකාල පොත් දත්ත ගබඩාවේ වාර්තාගත ක්ෂේත්‍ර අතර වෙනස්කම් රාශියක් ඇති හෙයින්, පුස්තකාලයේ දී RFID LAS ආතර් සී කලාක් ආයතනයේ පුස්තකාලයට සෘජුවම ඒකාබද්ධ කිරීම ප්‍රායෝගිකව සිදු නොවීය. | අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතු අතර මිලටගත් භාණ්ඩ අදාල කාර්ය සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෘදුකාංග වල අයිතිය හිමි ආයතනයන්ගෙන් රු.6,263,252 ක් වටිනා මෘදුකාංග 04 ක් සෘජුවම මිළදී ගැනීම් සිදු කර තිබුණ අතර එවැනි මෘදුකාංග මිළදී ගැනීම් අවස්ථාවන් වලදී දේශිය ආදායම් බදු පනත ප්‍රකාරව මෘදුකාංගයේ අයිතිය හිමි ආයතනය විසින් එම මෘදුකාංගය විකුණා ලබන ආදායමින් 10% ක මුදලක් මෘදුකාංගය මිළදී ගනු ලබන රටට ආදායම් බදු ලෙස ගෙවිය යුතු වුවත් එම කොන්දේසිය පිළිබඳව මිල කැදවුම් සිදු කරන අවස්ථා වේ මිළ කැඳවීම් ලේඛනයේ සඳහන් නොකිරීම නිසා මෘදුනාංග 02 ක් වෙනුවෙන් අදාල නිෂ්පාදන ආයතනය රු.695,918 ක් වූ බදු මුදල ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. එම හේතුවෙන් රු.695,918 ක් වූ බදු මුදල ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය විසින් ආදායම් බදු දෙපාර්තමේන්තුවට<br>(ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ගණනය කිරීමට අනුව ) ගෙවා තිබුණි. | මෘදුකාංග මිල දී ගැනීම සඳහා අන්තර්ජාතික ගෙවීමක්සිදු කිරීමට දේශීය අදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන බදු නිෂ්කාශන සහතිකයක් අවශ්‍ය බව ලංකා බැංකුව විසින් සඳහන් කල අතර ටෙන්ඩර් කැදවන අවස්ථාවේදී, එම අවශ්‍යතාවය ටෙන්ඩර් කොන්දේසි වලට ඇතුලත් කර නොමැති බව ලංකා බැංකුව විසින් පෙන්වා දෙන ලදී.<br>නමුත් මෙවැනි ගනුදෙනු වලදී අදාළ වන අමතර ගෙවීම් සහ බදු අදාළ වීම් පිලිබදව පූර්ව දැනුවත් වීමක් ආයතනය සතුව නොමැති වූ බැවින් ඉහත අමතර ගෙවීම් සිදුකිරීමට සිදු වී ඇත. එහෙත් ඉදිරියේදී මෙවැනි ජාත්‍යන්තර මට්ටමේ ගනුදෙනු සිදු කිරීමේ ක්‍රමවේදය විධිමත්ව අධ්‍යනය කර අදාල ලියකියවිලි සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන් පිළිබඳ නිසි ලෙස අධ්‍යයනය කර ගනුදෙනු වලට එලඹිය යුතු අතර සැපයුම්කරුව න්ගෙන් අයකල යුතු බදු ආදායම් නියමිත පරිදි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දී පුරප්පාඩු 17 සඳහා සේවකයින් බඳවා ගෙන තිබූ අතර විගණන දිනය වන විට ඔවුන් අතරින් සේවකයින් තිදෙනෙකු (රියදුරු-02, ඉංජිනේරු සහකාර) සේවයෙන් ඉවත් ව ඇති බව නිරීක්ෂණය විය. මීට අමතරව සම්මුඛ පරීක්ෂණ වලදී තෝරා ගත් අයදුම්කරුවන් අතුරින් අයදුම්කරුවන් දෙදෙනෙකු (වැඩ අධිකාරි හා කාර්යාල කාර්ය සහයක) සේවයට වාර්තා කර නොමැති බව නිරීක්ෂණය විය. ආයතනයට වඩාත් උචිත සේවකයන් බඳවා ගැනීම හා සේවකයන් රඳවා ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සැකසීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | ආයතනයට සේවකයන් බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින්, අයදුම්කරුවන්ගේ ඉලක්ක සහ ආයතනයේ පසුබිම සැළකිල්ලට ගනිමින් විධිමත් ආකාරයෙන් සිදු කරනු ලබයි. එහෙත් ආයතනයේ වැටුප් ව්‍යුහය සහ අනෙකුත් ප්‍රතිලාභ ඒ හා සමාන පෞද්ගලික අංශයේ රැකියා සහ තරඟකාරීත්වය ආදී කරුණු සැලකීමේදී ප්‍රමාණවත් නොවන බැවින් බඳවා ගන්නා අයදුම්කරු දිගු කාලීනව රඳවා ගැනීම දුෂ්කර කාර්යයක් වේ. එමෙන්ම වෙනත් රැකියා සහ විදේශයන්හි උසස් අධ්‍යාපන අවස්ථා ලැබීම හේතුවෙන් කෙටි කාලයකට පසු ඔවුන් සේවය හැර යාමේ ප්‍රවනතාවයට ආයතනය වර්ෂ ගණනාවක සිට මුහුණ දෙමින් සිටී. | සේවකයන් ආයතනය තුළ රඳවා ගැනීමට උචිත වූ වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ආ) | 2018 මාර්තු 20 දිනැති ලිපිය මගින් ආයතනය විසින් පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට කලමණාකරණ හා සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණු අතර පුරප්පාඩු සඳහා අනුමැතිය පිණිස යොමු කරන සංඛ්‍යාව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු බව නිරීක්ෂණය විය. | පර්යේෂණ ඉංජිනේරු, ඉංජිනේරු සහකාර, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු සහ කළමනාකරණ සහකාර යන තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතියට යොමු කිරීමේදී, මේ වන විට ආයතනය තුල රාජකාරී කටයුතු අකර්මන්‍ය නොවී පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත්, අත්‍යවශ්‍යම පුරප්පාඩු සංඛ්‍යාව පමණක් ආයතනයේ අවශ්‍යතාවය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පිණිස යොමු කරන ලදී. | ආයතනයේ ඉලක්ක ලඟා කර ගැනීමේදී අවශ්‍ය තනතුරු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2018/07/13 දිනැති ලිපිය මගින් කලමණාකරණසේවා දෙපාර්තුමේන්තුව මගින් අනුමැතිය ලබා දී ඇති ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමටත් , වසර 05 ක පමණ සිට පුරප්පාඩුව පවතින පොත් තබන්නා තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමටත් | 2018.07.13 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් තනතුරු දහයක් (10) සඳහා අනුමැතිය ලැබී තිබුනු අතර ආයතනයේ රාජකාරී කටයුතු අකර්මන්‍ය නොවී පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මත පිළිවෙලින් දැන්වීම් පල කර සේවකයන් බඳවා ගත් අතර මැතිවරණ කාල සීමාවෙන් පසුව | තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා නොපමාව ක්‍රියාකළ යුතු බව |

| | |
|---|---|
| ආයතනය කටයුතු කර නොතිබුණි. 2018/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොත් තැබීමේ කාර්ය භාහිර ආයතනයකට පවරා ඒ සඳහා රු.90,000 ක මුදලක් ගෙවා තිබුණි. | ජොෂ්ඨ පර්යේෂණ විද්‍යාඥයෙකු බඳවා ගැනීමට හා පොත් තබන්නා තනතුර සඳහා 2020 වර්ෂයේ බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අදාල අනුමැතිය ඉල්ලා ඇති අතර එය ලැබීමෙන් අනතුරුව අදාල බඳවා ගැනීම් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |